# 1.9 කම්මසරික්ඛතා ව්‍යවහාරයේ සදාචාරමය වටිනාකම

ඩබ්.ඒ ජී. විජයසිංහ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ඒ ඒ කර්මවලට අදාළව ආනිශංස පිළිබඳ විශ්වාසය කම්මසරික්ඛතාවයි. "කම්මසරික්ඛතා" යන ව්‍යවහාරය පෙතවත්ථු, විමානවත්ථු ආදී පාලි මූලාශ්‍රයවල නිතර දක්නට ලැබේ. මූලික බුදුදහමේ දක්වෙන ආනුපුබ්බීකථා, අනුපුබ්බකිරියා ආදී විග්‍රහයට අදාළව සරල ස්ථානයේ සිට උපරිමය වෙත ප්‍රවේශ වීමේ පසුබිම තුළින් ප්‍රකට වන සදාචාරමය පාරප්‍රාප්තිය විෂයෙහි පුද්ගලයා යොමු කරවීමේ දී අවශ්‍ය වන ප්‍රාථමික වූ අභිප්‍රේරණයක් ඇති කිරීම මෙහි මුඛ්‍ය අරමුණ වී ඇති බව පෙනේ.

මෙම ව්‍යවහාරය ශ්‍රී ලාංකේය ජන විඥානය තුළ දැඩිව අවශෝෂණය කරගත් ආකාරය දැකිය හැකිය. බුදුදහම මෙරටට හඳුන්වා දුන් මුල් අවදියේ ම ඉතා සාර්ථක ලෙස ජනප්‍රිය පසුබිමක් ඔස්සේ මෙම සංකල්පය ව්‍යාප්ත වූ බව පෙනේ. එහි දී ශ්‍රී ලාංකික ජනතාව ඔවුන්ගේ දැනුම, ආකල්ප ආදියට සරිලන අයුරින් මූලික බෞද්ධ ඉගැන්වීම් පරිවර්තනය කරගත් බව ප්‍රකටය, රසවාහිනිය, සහස්සවත්ථුප්පකරණය වැනි කෘති මඟින් මෙම චින්තනය වඩාත් ව්‍යාප්ත කිරීමට යොමු වී ඇති බවද සඳහන් කළ යුතුය. යථෝක්ත පසුබිම කේන්ද්‍රකර ගනිමින් සිංහල බුදුදහම, සිංහල බෞද්ධ සංස්කෘතිය වැනි යෙදුම් ව්‍යවහාරයට පැමිණ ඇත.

ඒ අනුව සිංහල බුදුදහමේ ප්‍රචලිත ජනප්‍රිය සංකල්පයක් වශයෙන් "කරුමේ" හෝ "කරුමය" හැඳින්විය හැකිය. මෙය බෞද්ධ විග්‍රහයේ දැක්වෙන "කම්ම" විෂය හා හාත්පසින්ම සම්බන්ධතාවක් නැත. ඕනෑම අවාසනාවන්ත සිදුවීමක් ගැන උපේක්ෂා සහගත සිතින් යුක්තව පූර්ව හවවල දී තමාගෙන් සිදු වූ පව් විපාකදීමක් වශයෙන් සලකා සැනසීමට උනන්දු කරවීම මෙමගින් සිදු වී ඇත. කම්මසරික්ඛතා යන්න මෙහි විරුද්ධාර්ථය ප්‍රකට කෙරෙන සංකල්පයයි. ආනිසංස පක්ෂය මෙමගින් නියෝජනය වේ. බොහෝ පිංකම්වලට සරිලන ප්‍රතිඵල පිළිබඳ විශ්වාසය මේ යටතේ දැකිය හැකි ය. ඒ අතර පහන් පූජාවෙන් නුවණැස ද මල්පූජාවෙන් පැහැපත් ශරීරයක් ද සණ්ටාර පූජාවෙන් ගැඹුරු මිහිරි කටහඬක් ද ආදී වශයෙන් ප්‍රතිඵල පිළිගෙන ඇත. මෙම ව්‍යවහාරය සමඟ පුනර්භව විග්‍රහය ද සම්බන්ධ වේ.

මෙසේ පවත්නා පරලොව පිළිබඳ විශ්වාසය කර්මය හා විපාක පිළිබඳ අවධානය පුද්ගල චර්යාව කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරයි. මෙලොව වශයෙන් පුද්ගලයා තුළ සන්තානගතව ඇති කරගනු ලබන ආකල්පමය තත්වය මත පරලොව තීරණය වන බව කල්පනා කිරීම මෙන්ම මෙලොව ජීවිතය දුක්සහිත යැයි පිළිගනු ලබන අතර ඊට හේතුව අතීත හවවල දී කරන ලද පාප කර්ම යැයි පිළිගැනීම මඟින් දෛනික ජීවිතයේ යහපත් ක්‍රියාවන්හි නිරතවීමට පෙළඹවීමක් ඇති වෙයි. මෙම උත්තේජනාත්මක චින්තනය මඟින් විෂඝෝර සර්පයින්, කෲරතර තිරිසන් සතුන් මෙන් ම තම සතුරු ජනයා කෙරෙහි පවා කරුණා මෛත්‍රී හැඟීමෙන් කටයුතු කිරීමට නිරායාසයෙන්ම උනන්දු වේ. තවද, ආගමානුකූලව ජීවත්වීමට ප්‍රබල උත්සාහයක් ද ඇති කර ගනු ලබයි. මෙම තත්වය සදාචාරවත් මානව ප්‍රජාවක් බිහිවීමෙහිලා ප්‍රබල අනුග්‍රහයක් ලබාදෙන බව සඳහන් කළ හැකි ය. එහෙයින් කම්මසරික්ඛතාව තුළ සදාචාරාත්මක වටිනාකමකින් යුත් සාරසංකල්පයක් වශයෙන් හැඳින්වීම වඩාත් යෝග්‍ය වේ.